**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති - 1) 2016**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහනේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ආසියානු සංවර්ධන බැංකුව හා ලංකා විදුලිබල මණ්ඩලය අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක එස්ආර්අයි 47037 දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොතට අනුව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ කාර්යක්ෂම හා විශ්වාසදායක පිරිසිදු විදුලිබල උත්පාදන පද්ධතියක් වැඩිදියුණු කිරීමයි. ආයෝජන වැඩසටහනේ කොටසක් ලෙස පුනර්ජනනීය බලශක්ති උත්පාදනය වැඩිකිරීම, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම හා ඉල්ලුම්ගත කළමනාකරණය තහවුරු කරගැනීම වැඩසටහන මඟින් ඉලක්ක කෙරේ. පහසුකම් පරිපාලන අත්පොතට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 28,509.80 කට සමාන එජඩො මිලියන 220 ක් වූ අතර ඉන් රු.මිලියන 23,325.50 කට සමාන එජඩො මිලියන 180 ක් මූල්‍යායනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් වැඩසටහනේ ව්‍යාපෘති - 01 යටතේ එකඟවී තිබුණි. මෙම වැඩසටහන එහි කටයුතු 2015 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය. මූල්‍යයන සැලසුම්, ණය ගිවිසුම් දෙකක් යටතේ සිදුකරන ලද අතර මූල්‍යායනය හා මූල්‍ය ප්‍රභවයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| <u>ප්‍රභවය</u> | **එජඩො මිලියන** | **රු.මිලියන** |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව - සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (OCR) ණය | 121.00 | 15,680.40 |
| ආසියානු සංවර්ධන අරමුදල් ණය | 29.00 | 3,758.10 |
| වරලත් (Franchise) නියෝජිතායතන සංවර්ධන ණය | 30.00 | 3,887.00 |
| ශ්‍රී ලංකා රජය | 40.00 | 5,184.70 |
| එකතුව | 220.00 | 28,510.20 |

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර

ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මතය**
**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහනේ (ව්‍යාපෘති - 1) මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 01 දින දීය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**
**--------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**
**-----------------------**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 180.00 | 23,325.50 | 3,958.00 | 4.32 | 640.00 | 5.07 | 750.00 |
| ශ්‍රී ලං ර | 40.00 | 5,183 .60 | - | - | - | - | - |
| ලං වි ම | - | - | 450.00 | 2.05 | 303.00 | 3.40 | 504.00 |
| එකතුව | 220.00 | 28,509.10 | 4,408.00 | 6.37 | 943.00 | 8.47 | 1,254.00 |

ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කරන ලද දිනයේ සිට වර්ෂ 1 ½ ක් ඉකුත්වීමෙන් පසුවත් 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 23,325.50 කට සමාන එජඩො මිලියන 180 ක වෙන්කිරීමෙන් සියයට 2.8 ක් නියෝජනය වන රු.මිලියන 750 කට සමාන එජඩො මිලියන 5.07 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින් ඉතිරි වර්ෂ 2 ½ ක කාල පරිච්ඡේදය තුළදී ණය මුදල්වල සමස්ත වෙන්කිරීම් මුදල උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිතව පැවතුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, ප්‍රධාන කොටස් 4 කින් සමන්විත වැඩසටහනේ (ව්‍යාපෘති - 01) කාර්යයන් හා 2016 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද කාර්යයන් පිළිබඳ භෞතික ප්‍රගතිය පහත පරිදි විස්තර කෙරේ.

(අ) ජල විදුලි උත්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා මොරගොල්ල හි ජල විදුලි බල පිරියත ඉදිකිරීමට ලංසු ලියකියවිලි සමාලෝචනය කිරීම සඳහා උපදේශක කොන්ත්‍රාත්තුව 2016 ඔක්තෝබර් 24 දින ප්‍රදානය කර තිබූ අතර උපදේශකවරයා විසින් 2016 දෙසැම්බර් 01 දින කාර්යයන් ආරම්භ කර තිබුණි. තවද, උඩ පළාත හා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.මිලියන 7.20 ක මුදලක් 2014 නොවැම්බර් මාසයේ තැන්පත් කර තිබුණද, මොරගොල්ල ජල විදුලි බල පිරියත ඉදිකිරීම සඳහා ඉඩම් අත්කරගැනීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබුණි.

(ආ) විදුලි සම්ප්‍රේෂණ යටිතල ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා කප්පල්තුරෙයි හි විදුලි උපපොළ ඉදිකිරීම් වැඩ හා කෙරවලපිටිය, කටුනායක හා ත්‍රිකුණාමලය විදුලි උපපොළවල් වැඩිදියුණු කිරීමේ වැඩ කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් සියයට 21 ක අඩු භෞතික ප්‍රගතියක් පැවති බව නිරීක්ෂණය විය. තවද, කැස්බෑව හා කළුතර විදුලි උපපොළවල් ඉදිකිරීම හා අනුරාධපුර පැරණි විදුලි උපපොළ වැඩිදියුණු කිරීම් වැඩ අදාළ කාර්යයන් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ආරම්භක අදියරේ පැවතුණි.

(ඇ) ලංකා විදුලි බල මණ්ඩලය විසින් මූලික රැහැන් මාර්ග පැහැදිලි කර ගැනීම හා ආකෘති සැලසුම් කිරීම පිළිබඳ කාර්යයන් ආදිය ප්‍රමාදවීම් හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම සඳහා කිලෝමීටර් 92 ක 33kv මධ්‍ය වෝල්ටීයතා රැහැන් සවිකිරීම යටතේ වැඩ හා වවුනතිවු හා මාදම්පේ ගැන්ට්‍රි ඉදිකිරීම 2016 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. කෙසේ වුවද, රු.මිලියන 110.11 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් 2015 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඈ) බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා ඉල්ලුම්ගත කළමනාකරණය වැඩිදියුණු කිරීම යටතේ කාර්යයන් ආරම්භ කිරීම සඳහා වැඩසටහන විසින් 2016 දෙසැම්බර් 31 වන විටත් කටයුතු ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් බලශක්ති ඉතිරිකිරීම් ඉලක්ක ආදිය ඉටුකර ගැනීම සඳහා ස්මාර්ට් ග්‍රිඩ් හා මීටර් තාක්ෂණයන් භාවිතා කිරීම, සුහුරු බලශක්ති ඉතිරිකිරීම් සහිත ගොඩනැගිලි තාක්ෂණය යළි සවිකිරීම හා කොළඹ තෝරාගත් ගොඩනැගිලිවල ශීත උණුසුම් ගබඩාකරණ සවිකිරීම් ආදී ඉල්ලුම්ගත කළමනාකරණ කාර්යයන් සඳහා උප කාර්යයන් සිදුකර නොතිබුණි.

**3.3 ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------**

වැඩසටහනේ (ව්‍යාපෘති -1) කාර්යයන් වල නියුතු කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ කාර්යයන් සඳහා යොදාගැනීමට සෘජුවම මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ඉඩ සලසා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළ වැඩසටහන (ව්‍යාපෘති - 1) විසින් සපයන ලද අරමුදල් වලින් රු.මිලියන 225.50 ක පිරිවැයකට මෝටර් වාහන 21 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා ණය සපයන නියෝජිතායතනයේ එකඟත්වය තහවුරු කරගැනීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී, මෝටර් වාහන සෘජුවම ආනයනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කළේ නම් රු.මිලියන 201.15 ක පිරිවැයකට සමාන වර්ගයේ මෝටර් වාහන ප්‍රසම්පාදනය කළ හැකිව තිබූ බව අනාවරණය විය.

**3.4 මූල්‍ය පාලනයන්**

**------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 134(3) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) වැඩසටහනේ (ව්‍යාපෘතිය - 1) කාර්යයන් කොටස් 05 කින් සමන්විත වූ අතර වැඩසටහනේ (ව්‍යාපෘතිය - 1) එම කොටස් අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම පිළිබඳ කාර්යයන් ලංකා විදුලිබල මණ්ඩලය මගින් මෙහෙයවන ප්‍රදාන වලින් මූල්‍යායනය කෙරෙන සියලු ව්‍යාපෘතිවල අධීක්ෂණය සඳහා වගකියනු ලබන අතිරේක සාමාන්‍යාධිකාරී වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන්ගේ විෂය පථය යටතේ පැවතුණි.